(පැසැඳිලි කිරීමක් + සීයා ආවාද? උඹලා නැවාද? දවසකියය දොඩන බසස්ඳ දිරිඝ ස්වරය ත්‍රස්ව ඒ කියපෙනා බව ඔබ දන්නි. අපේ භාෂා ඊතිය අනුව පදසාන අඟ ඇති +අ+ යන්න ව්වනතව හැ.ව්ය පනහයක. මේ ගැටළුවට පිළියමක් වශයෙන් ත්‍රස්ව කොට හැ.ව්ය ගුතු ව්වනා ආ යන්න (දීරඝය) හැඳින්වීම සඳහා ඇපෙලිලට හල් ලකුණක් යොදා +ා + ලියමි. ඒ අනුව +සීයා ආවාද? උඹලා නැවා ද? කියව්ය යුගයේ +ආ+ ස්වරය ව්වනත + අ+ ආ ඇතිවය. එහේ : (ව්සරගය) යොදා ඇති හැ.ව්යටයි. මෙය අත්හදා බැලීමකි)

මීට අවුරුදු පනහකට විතර ඉස්සර පෙන්නපු චිත්‍රපටියක එඩි ජයමාන්න, මේබල් බිලැයිත් කියන දෙන්නත් රඟපෑවා. චිත්‍රපටියෙ නම නං මට හරියට කිව්වි නෑ. ඒකෙ ටිකට් පත්‍රිකාවක ඒ දෙන්නෝ කියන සින්දුවක කෑලි කීපයක් මට මතකයි.

මම මනමාලි ඔබේ රූපම ලොරේ පාමු රැඟුම්.....
දෙවියෙක් වාගෙ මෙයා ආවාගේ මාව සොයා.....
කඳිමට උඹම මමත් මම් උඹටත් මැව් රෙනවා.....

මේ සින්දුවේ තුන්වෙනි පදේ දෙපළෙම කියන්නෙ මම උඹට මැව් වෙනවා කියන එක ඕසක් මම උඹටත් උඹ (මෙ)මටත් මැව් වෙනවා කියන එක නෙවේ.

සැමුවෙල් රුදිඳු, ඇනස්ලි ඩයස්, බද්‍රිපි ගුණතිලක, තුන්දෙනාගෙ ටිකට ජවනිකාවක තියෙනවා ඌ මට ගහනවා... මට ඌ ගහනවා.. කියලා කෑල්ලක්. එතනත් දෙපළෙම කියන්නෙ ඌ මට ගහනවා කියන එක ඕසක් ඌ මට ගහනවා.. මං ඌට ගහනවා කියන එක නෙවේ. මට හිතෙන හැටියට සින්දුවෙ නම් වැරැද්දක් තියෙනවා. ටිකට ජවනිකාව හිතා මතා කරපු ප්‍රබන්ධයක්.

මේ තැන් දෙක මට මතක් උනේ මොක ද කියලා ඔය ඇත්තො දැන ගන්න කැමති ඇති නේ. නේ ද? ඕං එහෙනං අහගන්ට.

අපේ සිරියාවතී හාමිනේගෙ නංගි කෙනෙක් ඉන්නවෝ මාරම්ල. උන්දෑ බැඳිලා ඉන්නෙ එහේ කතෝලික ආගමේ මහත්තයෙකුට. එයත් දැං ආගමේ. කව්රුත් හොඳං ඉන්නවෝ. ලෝකු මහත් වෙච්ච දරුවො දෙන්නෙකුත් ඉන්නවෝ. ඒ නංගි හැම නත්තලකටම අපටත් කාඩ් එකක්/කාරයක් (Yard = යාර - යාරය, Card= කාර- කාරය) එවනවෝ, සිරිතක් වසසෙං. අපිත් ඉතිං ගිරව් වගේ ඒක කියෝනවෝ. හැඩ බලනවෝ. ඒකෙ තියෙන පින්තූරෙ තේරෙමක් - සම්බන්ධයක් දැන්නෑ. සිරියාවතී හාමිනේත් හොඳ නත්තල් කාරයක් අරගෙන ලියුං කරදිහ් කෑල්ලකුත් එක්ක ඔව්න්ට යවනවෝ. පහුගිය නත්තලේදී ඔය සිරිත පොඩ්ඩක් වෙනස් උනා.

අපරාදෙ කියන්න බෑ මං මොකක් හරි කිව්වාම ඒකට පුප්පන, ගොරෝන, දික් කරන සිරිතක් වත් ඒකට උඩිං යන සිරිතක් වත් අපේ සිරියාවතී හාමිනේගෙ නෑ. කීකරු බාරියාවො උනා ම එහෙන නෙත්.. නේද? ඒක අපට අපේ සඟිස්කූර්තියෙං උරුම වෙච්ච සිරිතක්. ගෑනු කම තියෙන ගෑනි ඉස්ත්‍රි රත්නයක් කියන්නෙ ඒක නෙත්.. හැබැයි ගෑනු කම ගෑවිලාවත් නැති ගෑනුත් ඉන්නවෝ ඒ තරම්.

කතෝලික නෑදෑයො හිතවත්තු අපට නත්තල් කාර එව්වා ම අපිත් ඔව්න්ට නත්තල් කාර යැව්වා තමයි. ඒත් කලක ඉඳං මගේ හිතට හරි නෑ ඒ වැඩේ කෙරෙන හැටි. කතෝලික ඇත්තො අපට එවන්නෙත් නත්තල් කාර. අපි යවන්නෙත් නත්තල් කාර. එතන කිසිම යුක්තියක් ගැලපීමක් නෑ. කතෝලික ඇත්තො තමන්ගෙ වැදගත් ආගමික උත්සවේ දි ආගමේ බේදයක් නැතිව නෑයන්ට හිතයන්ට සුබ පැතුම් කාර යවනවෝ. ඒක හොඳ හිතිං කරන හොඳ තේරුමක් ඇති වැඩක්. ඒ කාර ලබන අයත් ඒකෙං ලොකු සතුටක් ලබනවෝ. හැබැයි ඒකෙං අදහස් වෙන්නෙ නෑ අනෙක් ආගම් අදහන අයත් ආපහු නත්තල් කාර ම යවන්න ඕනෙය කියලා. අපි හිතමු ඇන් කියලා කතෝලික ලමයෙක් මීනා කියලා හිඳුදු යාලුවෙකුටයි අම්රා කියලා මුස්ලිම් යාලුවෙකුටයි සාමා කියලා බව්ද්ද යාලුවෙකුටයි නත්තල් කාර තුනක් එව්වයි කියලනි.

ඉතිං මීනයි, අම්රයි, සාමයි තුන් දෙනත් ආපහු ඇන්ට නත්තල් කාර ම යවන්න ඕනෙයේ? මගේ හිත කියන්නෙ ඒ ක්‍රමේ වැරදියි කියලනි. ඒ තුන් දෙනා තම තමංගෙ ජාතික ආගමික උත්සවේකදි සුබ පැතුම් කාරයක් ඇන්ට යවන එක නේද හරි.? මීනාට පුලුවං දීපාවලි/තස්පොංගල් වගේ උත්සවයකදී කාරයක් යවන්න. අම්රාට පුලුවං රාමසාන් වගේ උත්සවයකදී කාරයක් යවන්න. සාමාට පුලුවං වෙසක් කාරයක් යවන්න.

මං නේද එදා සිරියාවතී හාමිනේට කියලා නත්තල් කාරයක් යැවීම නැවැත්තුවෝ. එවාපු නත්තල් කාරයට ස්තුති කරලා අපි හොඳ ලිව්මක් යැව්වනි.

පහුගිය වෙසක් කාලේ අපි ඔව්න්ට වෙසක් කාරයක් යැව්වනි. හැබැයි එහෙම එකක් ලැබුනු බවක් වත් මෙතෙක් ඔවුං අපට දැන්නුවෙ නෑ. මට හිතෙන්නේ මේ අව්රුද්දෙ අපට නත්තල් කාරයක් නොලැබෙන්නත් පුලුවං. අපි කව්රුත් දයාව දක්වන්නං අපට පහලිං ඉන්න අයට. අපිත් එක්ක හරි හරියට ඉන්න අයට හරි අපිට ඉහලිං ඉන්න අයට හරි දයාව දක්වන්න අපි එව්වර උනන්දු වෙන් නෑ. අපි අපේ ආගමට වගේම අනුංගෙ ආගමටත් ගරු කරන්න ඕනෙ. හැම ආගමකම තියෙන්නෙ ව්ස්වාසෙ, ඇදැහීම්. ආගමක ඇත්ත නැත්ත, හරි වැරදි සොයන්න යන එක නුවනට හුරු වැඩක් නෙව්.

කාර යැවීමේ හොඳ ක්‍රමේ ඒක නෙව්. මෙන්න මේ ක්‍රමේ ගැන හිතලා බලන්නකො.

අපි ඔව්දියො හින්දා නඟා අපට වෙසක් කාරයක් එවනවා. නංගිලා කතෝලිකයො හින්දෑ අපි ඔව්න්ට නත්තල් කාරයක් යවනවෝ. ඒක හරියට උපන් දින සුබ පැතුම් කාරයක් යවනවෝ වගේ. තමංගෙ උපන් දිනේට අනුන්ට කාර් යවලා බැඩක් නෑ නේ. ඒක තමය් නිවැරදි ක්‍රමේ. ගැද්දං මං අහන්නෙං. ? මොකද මේ ඇත්තො මේ ගැන කියන්නෙං? තමංගෙ සතුට අනුන්ට බෙදා දෙන එක හරිදෑ? අනුංගෙ සතුටට තමනුත් හවුල් වෙන එක හරි ද?

(මං Card (කාඩ්) යන වචනය කාර/කාරය/ කාරයට කියලනි යෙදුවෙ තේරුමක් ඇතිව. Yard (යාඩ්) යන වචනය යාර/යාරය/යාරයට යන ව්‍යවහාරය ගැන හිතන්න. මේ ඇත්තෝ කැමති නං ඒක ගන්න. නැත්නං කාඩ් එක/කාඩය දිගටම බාව්තා කරන්න. වාද ව්වාද ඕන් නෑ) ■

සිසිර දිසානායක

මේ ටිකිරි ටිකිරන්ගේ මාසයයි

කාපු බීපු වෙලාවට කියන කරන දේවල් ගැන සිහිකල්පනාව තියෙන වෙලාවට හිතාගන්න ටිකක් අමාරුයි. පහුගිය මාසයේ ලියපු ඇඳපු දේවල් සන්නස පත්තරේ දැක්කාම්යි පන්හිඳාටයි පින්සලටයි මතක් වුණේ ගිය වතාවේ කරපු කියපු දේවල්.

තේරව්ල්ලක්ම අඳිනවා කියලා පණ්ඩිතයා වගේ අන්දාමෙන් දැන් ඉතින් තෝරාලා දෙන්න වෙයි. පන්හිඳ කිව්වා. පන්ගේ අභියෝගය බාරගන්න ඇන්දාට මොකද දැන් ඒ දේවල් ගැන කිසි හිනව්වක් නැතිවා වගේ ඕන් ඕගේ ලබාගත්තු අත බලාගෙන ඉන්නවා. පන් ට දුක හිතුණා. පදම් වීකක් වැඩි වුණත් තමන් ලියන දේ ගැන පන්ගේ කල්පනාව පින් ට වැඩිය ටිකක් විතර හොඳයි. ඒ නිසා ම පින් අඳින දේ ගැන පොඩි ඉඟීයක් දෙන්න පන් අමතක කළේ නැහැ. ඒ ටිකිරි ටිකිරියන් ගැන ලියපු අන්තිම වචන විකෙන්.

මේ ටිකිරි ටිකිරන්ගේ මාසයයි. ලෝක ළමා දිනය යෙදී ඇති මෙම මාසයේ ඒ පිළිබඳව යමක් ලියැවුණොත් එය වඩාත් කාලෝචිත වනු ඇත. මානව වර්ගයාගේ අනාගතය නංවන ළමාවරුන් පිළිබඳව අන්තර්ජාතික වශයෙන් අවධානයට ලක්වන මෙවන් කාලකවාදානුවක සමස්ථ ලෝක වැඩිහිටි ප්‍රජාවගෙන් ඔවුනට පිළෙන්නේ කිනම් වූ සමීපත් ද සාධර්මද යන්න විමසා බැලීම වඩාත් වැදගත් වනු ඇත. සක්වල තලයේ ඉහළම බුද්ධිමත් බව්න් සහ ඒ නිසාවෙන් ම සෑම අංගයකින් ම අගතැන්පත් ව ධර්මය දරා සිටින වැඩිහිටි පරම්පරාව සිය කිරුළු මතු පරපුරට දායාද කරන්නේ කවර ආකාරයකින්දැයි සිතා ගත නොහේ. සිය කිරුළ හිසින් ඕදුවා දරුවෙකු හිස පැළඳවීමට සැරසෙන නරපතියෙකුත් එළෙස ප්‍රශ්ණාර්ථයෙන් බලා සිටිනා දරුවාත් ගියවර සන්තස කලාපයේ සිතුවම් විය.. පන් පින්ගේ ජාම බේරලා දුන්නා.

"හැබැයි ඉතින් ඔය පණ්ඩිත වාක්‍ය පොඩ් එවුන්ට නම් තේරෙන්නෙ නෑ. උන්වත් තේරෙන සිංහලයකින් ලිව්වොත් නරකදෑ" මෙදා පාර පින්ටත් කටට පණ ඇවිත්.

පන්ට මල පැන්නා.

"මදැයි උදව් කරන්න ගියා.. එහෙනම් මෙන්න තමුන්නැහේම ලියාගන්න එකයි ඇත්තෙ.."

පන් ෆුල්ස්කැප් කොලේ පින් දිහාට විසි කළා.

"තරහ අවසර.. සෙල්ලමට වගේ අපි ඒ වැඩෙත් කරලා බලමුදැ..?" පින් ට හිනා.

"සුභ සහ යස වගේ වෙයිද කියලයි බය.."පන්ගෙත් කේතිත්ත ටිකක් ඇඩු වුණා. ළමයින්ට තේරෙන හැටියට ලියන ඒවා විතරයි පින්ට ලියන්න තේරෙන්නෙ.

පුංචි දුවේ පුතේ.. නංගිගේ මල්ලියේ.. ඔයාලා වෙනුවෙන්ම එක දවසක් වෙන් කරලා නම් හොඳටෝම මදි. අව්වරුද්දේ අවස් ඝන්සිය හැටපනම වෙන් කරලත් මදි වගේ. ඔයාලාගේ අම්මලා තාත්තගා ඒ අය උපන්න රටත් අතහැරලා දාලා මේ රටට ඇවිල්ලා තියෙන්නේ කැමැත්තෙන්ම නෙවෙයි. ඒ අය බොහෝම දෙනෙක් හිතන්නේම ඔයාලගේ අනාගත දියුණු ගැන. පරිස්සම ගැන. දියුණු රටක ළමයින්ට ඉගෙනගන්න බොහෝම දේවල් තියෙනවා. ඒවාට පහසුකම් තියෙනවා. ඒවායින් හොඳට ප්‍රයෝජන අරගෙන හොඳින් ජීවත්වෙන්න පුරුදු වෙන එක තමයි ලොකුම දේ. මොන දේවල් ඉගෙන ගත්තත් මොන රස්සාවල් කළත් අනුන්ට කරදරයක් නොකරන හොඳ අප වුණොත් කවුරුත් ඒ අයට ආදරෙයි. නරක දේවල් වලට පුරුදු නොවෙන්න පරිස්සම් වෙන එක තමයි අමාරුම වැඩේ. හොඳ දේට පුරුදුවෙනවාට වැඩිය බොහෝම ලේසියි දේ තමයි හොඳ ළමා ගති පැවතුම්. උපතින්ම අපිට ලැබෙන හොඳ ළමා සිරිත් විරිත් රැකගන්න උනන්දු වෙන්න ඕනෙ. ලොකු වැඩිහිටි අය කරන දේවල් කරන්න තව කාල් තියෙනවා. ළමයි විදියට ඉන්න තියෙන මේ කෙටි කාලයත් ලොකු අය විදියට බන්න පුරුදු වුණොත් ලොකු වුනාම ඒ ගැන හරියට දුක හිතේවි. ඉතින් දුවන්න පනින්න, නටන්න, ගයන්න, අඳින්න, රඟන්න, සෙල්ලම් කරන්න. මේ ඔක්කොම එක්ක පාඩම් වැඩත් කරන්න.

මේ දේවල් වලට මේ රටේ ඉන්න අපට ඕනෙ තරම් ඉඩ කඩ තියෙන බව කියන්න ඕනෙ නෑ.

අපේ ඕල් වුණ ලංකාවෙ දේවලුත් ඉගෙනගන්න පුහුණු වෙන්න දැන් දැන් ඕනෙ තරම් ඉඩ කඩ ලැබෙනවා. හැම පන්සලකම වගේ තියෙන දහම් පාසල් මෙයින් ඕල් තැන ගන්නවා. ඒත් එක්කම තියෙන සිංහල ඉස්කෝල වලට යන්න දුලා පුතාලා දැන් හරි උනන්දුයි. ඒ ඒබාග වලදී ලකුනු එහෙමත් එකතු වෙන නිසාත්. දරුවන්ට නොයෙකුත් විදිහේ නැටුම්, සංගීත පන්හි තියෙනවා. චිත්‍ර පන්හිත් පටන්ගන්නවා නම් හොඳයි. ලංකාවේම ඉපදුන චිත්‍ර කලාවක් තියෙන බව ගොඩක් දෙනෙකුට අමතකයි. සංගීත කණ්ඩායම් වල නැටුම් කණ්ඩායම් වල නාට්‍ය වල අද දස්සකම් පෙන්වන්නේ ළමා කාලයේදීම මේ දේවල් ඉගෙනගත්ත අය.

අපේ ඕල් රටෙන් අපට ලැබෙන දායාද ගැනත් උනන්දු වෙනවා නම් හොඳයි. අපට හොඳදැනුවත්වව ළමා ගීත, චිත්‍රපට වගේ දේවල් හරියට කෙරෙනවා. හොඳ උදාහරණයක් තමයි සොම්රන්න දිසානායක මාමා හදපු සූරිය අරණ චිත්‍රපටය. ළමයි කියලා කියන්නේ මොන වගේ හිතන පතන අය ද කියලා කියා දෙන ළමා කම් පෙන්වන ළමා චිත්‍රපටයක් ඒක. රෝහණ විරදීහ මාමාගේ සංගීතයට හර්ෂන දිසානායක දරුවා

7 පිටව